IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**
**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණය - 2015**
**ප්‍රථම සෙමෙස්තරය**
**(පවත්වන ලද්දේ 2016 දෙසැම්බර)**

# DY 01 – සිංහල

**විභාග අපේක්ෂකයින්ට උපදෙස් :**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ තුනයි. **(03)**

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් **(08)** සහ පිටු දෙකකින් **(02)** සමන්විතවේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. (අ) පහත දැක්වෙන යෙදුම්වල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න. (වචන දෙකම ලිවිය යුතුය)

i. අත්‍යවශ්‍ය ගණුදෙනු
ii. ධෛර්යමත් සෙබළු
iii. කුරුලු කැදලි
iv. නර්ථන නිරීක්ෂණය
v. ළසෝ ගිණිදැල්
vi. විවිධ අර්බුධ
vii. නළ ලිඳ
viii. අළුත් රඟහල
ix. නිවුණු පහන
x. ආස්වාදජනක සන්දර්ශණ
xi. කනිෂ්ඨ නිළධාරී
xii. ව්‍යංගාර්ථ ගවේෂණය
xiii. ඌන සාමර්ථය
xiv. පරිගනක දෘඩාංග
xv. ලැව්ගිනි මර්දනය
xvi. භාහිර සම්භාධක
xvii. ඖෂධ ප්‍රතිපත්තිය
xviii. ඓතිහාසික සාදක
xix. නීත්‍යනුකූල ප්‍රටිචාර
xx. දාතම දරණ

(ආ) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. උත්සවයට පැමිණි කාන්තාවන් මා හරසරින් පිළිගත්හ.
ii. ජයසිරිගේ පියාණන් හදිසියේ අභාවප්‍රාප්ත වූහ.
iii. පොලීසිය පුද්ගලයන් දෙදෙනෙක් අත්අඩංගුවට ගනියි.
iv. විමලධම්ම නම් බුදු පුතුන් අද සන්ධ්‍යාවේ අවසන් ගමන් වඩිති.
v. සෞඛ්‍ය ඇමතිවරිය නව රෝහල විවෘත කරනු ලැබුවාය.
vi. සභාවේ සිටි ඇතමෙකු ඒ යෝජනාවට විපක්ෂ විය.
vii. රුහුණු විශ්ව විද්‍යාලයට තේරී ඇති මා කොළඹ විශ්වවිද්‍යාලයට මාරුවක් පතමි.
viii. නාහිමියන් අපවත් වූහයි ප්‍රවත්පත වාර්තා කළේය.
ix. අන්තඃපුරය හොරු කඩයි.
x. පරාර්ථකාමී මිනිසුන් ලෝකය තවත් ලස්සන කරයි.

2. උම්මග්ග ජාතකයේ එන මහෞෂධ චරිතයේ සංකීර්ණ ලක්ෂණ මතුවන අවස්ථා තුනක් ගෙන හැර දක්වන්න.

3. 'ගුත්තිල හා මූසිල වැනි පුද්ගලයන් අද සමාජයේ වුවද දැකිය හැකිය' විමසන්න.

4. 'වෑත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභා ශක්තිය මතු වන්නේ සාම්ප්‍රදායික වර්ණනාවලින් නොව ස්වාධීන වර්ණනාවලිනි' විමසන්න.

5. “යශෝරාවයෙහි බලදේව අපට ප්‍රිය වන්නේ ඔහුගේ යථාර්ථවාදී පැවැත්ම නිසාය.” විමසන්න.

6. ‘කෙටි කතා රචනයෙහි ලා ජී. බී. සේනානායක මහතා රචනා ක්‍රම තුනක් භාවිත කරයි’ නිදසුන් ඇසුරෙන් පිරික්සන්න.

7. ස්වකීය නිර්ව්‍යාජ අනුභූති කවියට නැඟීමේදී කවියෝ විවිධ උපක්‍රම භාවිත කරති. එවැනි උපක්‍රම කීපයක් ගෙන හැර දක්වන්න.

8. පහත දැක්වෙන කවි පෙළෙහි සාහිත්‍යමය අගය විමසන්න.

**පින් නැත්තෙමි**

පිරුවට හැඳ
බඩ පිරුවට බැඳි
සිහින් උස
කරනැමි සිතෙහි
අන්දම් වරදීදෝ
රද තෙදින්
බිය සැක
පොර බදා.

රජ,
ඔහු සැටියෙන්
සිත පෙළී
“කිසිදා
තා කෙරෙහි
සතුටු මුහණ
නො දක්මි” කී
රන්වන් දිගටි මුහුණ
කරය ගලා බසිත
රජ සොවින් සිතී:
“කරනැමි
තුටු සිතින් අනුන්
බිය සැකින් මා
දළ රවුළු කපා.
පින් නැත්තෙමි මමි.”

**-ජී බී සේනානායක**